ලිියාපදිංචි අංකය
பதிவு இல :1151
Registered No

# ලංකා බැංකු සේවක සංගමය
# இலங்கை வங்கி ஊழியர் சங்கம்
# CEYLON BANK EMPLOYEES' UNION

අංක 20, පන්සල පාරෙ කොළඹ 10. இல. 20, பன்சல வீதி, கொழும்பு 10, No. 20, Temple Road, Colombo 10
දුරකථන /தொலைபேசி/ Telephone:011-2693811/011-2674840, ෆැක්ස් /தொலைநகல்/ Fax: 011-2674840
E.Mail : cbeu@sltnet.lk, cbeu1@sltnet.lk, Web - www.cbeu.lk

(අභ්‍යන්තර විවරණිකාව - සාමාජිකයින් අතරේ පමණයි)

ප්‍රිය සහෝදරය/සහෝදරිය පී.යු.2019/36

## 2019-2021 නිල කාලය සඳහා ලංකා බැංකු සේවක සංගමයේ නව නිලධාරී මණ්ඩලය ඒකච්ඡන්දයෙන් තේරී පත් වේ

ලංකා බැංකු සේවක සංගමයේ ව්‍යවස්ථාවට අනුව පවත්වනු ලැබූ ශාඛා සංගම් නිලවරණයෙන් තේරී පත්වූ සියලුම ශාඛා සංගම් හි මධ්‍යම කාරක සභික සහෝදර සහෝදරියන් 2019-10-18 වැනි දින කොල්ලුපිටිය CMU ශාලාවේ දී රැස්වී 2019/2021 නිල කාලය සඳහා ලංකා බැංකු සේවක සංගමයට නව නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගන්නා ලදී.

රාජ්‍ය හා පෞද්ගලික දෙපාර්ශවයම නියෝජනයවන පරිදි, ශාඛා සංගම්වල එකඟතාවය ද සහිතව මව් සංගමයේ නිලධාරී මණ්ඩලයේ සියලුම දෙනා තේරී පත්වීම විශේෂත්වයකි. එය සංගමයේ යහපැවැත්ම උදෙසා මහඟු පිටිවහලක් වනු නොඅනුමානය.



ඒකච්ඡන්දයෙන් තේරී පත් වූ නව නිලධාරී මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 01 | සභාපති | - චන්න දිසානායක සහෝදරයා | - ලංකා බැංකුව |
| 02 | ජ්‍යෙෂ්ඨ උප සභාපති | - විමල් චන්ද්‍රසේන සහෝදරයා | - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 03 | උප සභාපති | - දිණුක සමරනායක සහෝදරයා | - හැටන් නැෂනල් බැංකුව |
| 04 | ප්‍රධාන ලේකම් | - රන්ජන් සේනානායක සහෝදරයා | - මහජන බැංකුව |
| 05 | ජ්‍යෙෂ්ඨ උප ලේකම් | - ඒකේශ්වර කෝට්ටෙගොඩ සහෝදරයා | - HDFC බැංකුව |
| 06 | උප ලේකම් (I) | - සම්පත් පීරිස් සහෝදරයා | - ජාතික ඉතිරිකිරීමේ බැංකුව |
| 07 | උප ලේකම් (II) | - ධනුෂ්ක කුමාරසිංහ සහෝදරයා | - සණස සංවර්ධන බැංකුව |
| 08 | උප ලේකම් (III) | - ප්‍රභාත් කොස්ගොල්ල සහෝදරයා | - මහජන බැංකුව |
| 09 | උප ලේකම් (IV) | - ජයලාල් සුදේශ් සහෝදරයා | - ලංකා බැංකුව |
| 10 | උප ලේකම් (V) | - දර්ශන ප්‍රේමලාල් සහෝදරයා | - ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව |
| 11 | භාණ්ඩාගාරික | - කුෂාන් විජයපාල සහෝදරයා | - කොමර්ෂල් බැංකුව |
| 12 | උප භාණ්ඩාගාරික | - එච් එම් පී බී හේරත් සහෝදරයා | - රාජ්‍ය උකස් හා ආයෝජනබැංකුව |

වසර 2 කට වරක් පවත්වන මෙම නිලවරණ ක්‍රියාදාමය කිසිදු ගැටලුකාරී තත්වයකින් තොරව සිදු කිරීම සඳහා දායක වූ සියලුම පාර්ශවයන්ටත් නිලවරණයේ අවසානය දක්වා වෙහෙස මහන්සි වූ සියලුදෙනාටත්, විශේෂ කැපකිරීමකින් යුතුව කටයුතු කළා වූ සංගමයේ කාර්ය මණ්ඩලයටත් සංගමයේ විශේෂ ගෞරවය හිමි වේ.

## කම්කරු පන්තිය ශක්තිමත් කරමු

ඉදිරි නිල කාලය සඳහා සභාපති ලෙස අභිනවයෙන් තේරී පත්වූ චන්න දිසානායක සහෝදරයා සභාව අමතමින් පසුගිය දෙවසරක කාලය සංගමය මෙහෙයවීමට තමන් ඇතුළු නිලධාරී මණ්ඩලයට දැවැන්ත ශක්තියක් වූ ශාඛා සංගම් විධායක සභිකයින් හා මධ්‍යම කාරක සභිකයින් ඇතුළු සමස්ත සාමාජිකත්වය ලබාදුන් විශිෂ්ඨ දායකත්වය අගැයීමට ලක් කරන ලදී. ඉදිරියේ දී පවතින අභියෝගයන්ට මුහුණ දීමට එම දායකත්වය ඊට වඩා ඉහළ මට්ටමකින් ලබාදෙනු ඇති බවට විශ්වාසය පළ කරන ලදී. සංගමයේ වගකීම් හා යුතුකම් පිළිබඳව අප මනාව අවබෝධ කරගත යුතු අතර එහිදී බැංකු සේවකයින් වශයෙන් පමණක් නොව රටේ සමස්ත කම්කරු පන්තිය නියෝජනය කරන පිරිසක් ලෙසත් රටේ පුරවැසියන් ලෙසත් කටයුතු කළයුතු බව අවධාරණය කෙරිණ.

රටේ ආර්ථිකයේ හැසිරීම මැනවින් අවබෝධ කරගත යුතු අතර උග්‍ර ණය බරකින් හෙබි රටක ආර්ථිකයට සෘජුවම සම්බන්ධ බැංකු පද්ධතියේ පැවැත්මට එල්ලවිය හැකි සහ එල්ලවන අභියෝග සුළු පටු නොවනු ඇති බව ප්‍රකාශ විය. එහිදී රාජ්‍ය හෝ පෞද්ගලික අයිතිය මත බැංකු පද්ධතිය වර්ගීකරණය කළ නොහැකි බවත් ප්‍රාග්ධන අවශ්‍යතාවන්, ජාත්‍යන්තර බාසල් නියමයන් හරහා මෙන්ම ආර්ථිකයේ කඩාවැටීම තුළ බැංකු මුහුණ දෙන අභියෝගයන් සරල නොවනු ඇති බවත්, අප එම සියලු තත්වයන්ට සාර්ථකව මුහුණ දීමට සන්නද්ධවීම අත්‍යවශ්‍ය බවත් විස්තර කරන ලදී.

## අභියෝග මැදින් ස්ථාවර සංගමයක් කරා...

වර්තමානය විශ්ලේෂණය කිරීමේ දී සංගමයේ පැවැත්මට පෙර නොවූ විරූ ආකාරයට එල්ල වී ඇති අභියෝග මැනවින් හඳුනාගත යුතු අතර දේශපාලන අවශ්‍යතාවන් හා වෙනත් අන්තවාදී පිරිස් සංගමයේ සාමාජිකත්වය හීන කිරීමට දරන උත්සාහයන් පරාජය කළ යුතු වේ. ජාත්‍යන්තර අවශ්‍යතාවන් තුළ රටේ ක්‍රියාත්මක කම්කරු අණපනත් වෙනුවට යෝජිත ඒකීය කම්කරු නීතිය හරහා කම්කරුවන්ට දැඩි අනාරක්ෂිත තත්වයකට මුහුණදීමට සිදුවනු ඇත. පෞද්ගලීකකරණය, විවිධ වෙළඳ ගිවිසුම් ආදිය මගින් පුරවැසියන් වශයෙන් හිමිකම් ලබන අයිතිවාසිකම් දරුණු ඛේදනයකට ලක්වනු ඇත.

මෙම සියලු තත්වයන් සලකා බැලීමේ දී සංගමය පක්ෂ දේශපාලනයෙන් තොර අවිච්ඡින්න ගමනක නියැලී සිටින පසුබිමක වෘත්තීය සමිති දේශපාලනයට තව තවත් ශක්තිමත්ව අනුගත විය යුතු බව ප්‍රකාශ කෙරිණ. ශක්තිමත් ජාතික ආර්ථිකයකට, ජාතීන් අතර සුහදතාව මෙන්ම නීතියේ ආධිපත්‍ය හා ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීමට සියලුදෙනා කැපවීමෙන් කටයුතු කරන ලෙස සහෝදරාත්මක ආරාධනාවක් ද ඉදිරිපත් විය.

## ලංකා බැංකු සේවක සංගමය දිගුකල් දිනේවා !

මෙයට - සහෝදරත්වයෙන්



**චන්න දිසානායක**
සභාපති



**රන්ජන් සේනානායක**
ප්‍රධාන ලේකම්

2019 ඔක්තෝබර් මස 18 වන දින